# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1756/26 – 2012 මැයි 04 වැනි සිකුරාදා – 2012.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ඩීඑස්/කේජීකේ/3/2/ජල/2005/23.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟවට කෝරළය සුළු කොට්ඨාසයේ, අංක 247, බෝවලවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බෝවලවත්ත ගමේ පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (මහනුවර දිස්ත්‍රික්කය) විසින් පිළියෙල කරන ලද අංක මු.පි. මහ 6171 හා 2012.01.11 දිනැති පිඹුරෙහි සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0304 ක් වූ ඔගස්ටාවත්ත ඉඩමේ ඉඩම් කැබලි එක (01).

**කැබලි අංක 01**
ඉඩමේ නම: ඔගස්ටාවත්ත; මුල් හිමිකම් කියන අය: කළමනාකරු, කැන්ඩි සිටි මිෂන් ආයතනය, ඩී. එස්. සේනානායක වීදිය, මහනුවර; ප්‍රමාණය: හෙක්. 0.0304.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජූනි මස 27 වැනි දින ප.ව. 2.00ට මහනුවර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජූනි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩී. එම්. එන්. ජී. ජී. ටී. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර සහ ගඟවට කෝරළය.

2012 අප්‍රේල් මස 27 වැනි දින,
මහනුවර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 – 489

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ප්‍රාලේබ/ඉ/7/2/108.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හෙල උඩ පළාතේ මැද කෝරළේ 256/ඒ බලංගොඩ නගරය තුළ පිහිටි මැනුම්පති විසින් සකස් කරන ලද කැඩැස්තර සිතියම්

අංක 620077 කලාප 07න් 03 වැනි කලාපයෙහි ප්‍රමාණයෙන් හෙක්. 0.0015 ක් වූ පහත සඳහන් ඉඩම් කැබලි:

01. **කැබලි අංක 280**
ඉඩමේ නම: පිටලියද්ද; හිමිකම් කියන අය: වඩුගේ වයලට් ඇග්නස් ප්‍රනාන්දු; ප්‍රමාණය: හෙක්. 0.0013.

02. **කැබලි අංක 282**
ඉඩමේ නම: පිටලියද්ද; හිමිකම් කියන අය: උඩහ මාකඳුරගේ අනිල් සංජීව මාකඳුර; ප්‍රමාණය: හෙක්. 0.0002.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජුනි මස 16 වැනි දින පෙ.ව. 10.00ට බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජුනි මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඊ. එස්. ජී. එදිරිසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
බලංගොඩ.

2012 අප්‍රේල් මස 26 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 – 490

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

මගේ අංකය: ව/ඉ2/201/01-v වෙළුම.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනාන ගමේ, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක 76 අතිරේක අංක 15 සහ 2012.01.11 දිනැති අවසාන ගම් පිඹුරේ කැබලි අංක 449 සහ 450 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0635 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි දෙක (2).

1. **කැබලි අංක 449**
ඉඩමේ නම: දික්දෙනියෙහේන; විස්තරය: ගෙවත්ත, වසස අවු. 05-15ක් පමණ වයසැති තේ ගස් 40ක්, අඹ ගසක්, කොස් ගසක්, පුවක් ගස් 4ක් සහ කොට්ටම්බා ගසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: විල්සන් ගුණපාල ජයනෙත්ති, වනපුළුගොඩ වත්ත, වලගෙදර; ප්‍රමාණය: හෙක් 0.0355.

2. **කැබලි අංක 450**
ඉඩමේ නම: පොල්වත්ත කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පන්නිල විතානගේ ජිනෝරිස්, "සමන් ", ගෝනමළුව, පන්නිල; ප්‍රමාණය: හෙක් 0.0280.

ඉහත සඳහන් ඉඩම්වල හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජුලි මස 18 වැනි දින පූ.භා 10.00 ට වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2012 ජුලි මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එම්.එල්. දශිත තිරෝෂන,
ප්‍රාදේශීය ලේකම්,
වලල්ලාවිට.

2012 අප්‍රේල් මස 27 වැනි දින,
වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 – 491

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.